# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

## අභිලාෂ ප්‍රකාශ කිරීම

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අයත් විශ්වවිද්‍යාල රෝහලෙහි ස්ථාපිත කර ඇති කාමර 50 කින් යුත් ආගන්තුක නිවාසය සහ ආපනශාලාව වෛද්‍ය සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉදිකර ඇති අතර රෝහල් ප්‍රතිකාර ලබන දේශීය/විදේශීය රෝගීන්ගේ පවුල් සාමාජිකයන් සඳහා නේවාසික පහසුකම් ලබා දීම අරමුණු කර ගනිමින් මෙම විශ්වවිද්‍යාල රෝහල් ආගන්තුක නිවාසය ඉදිකර ඇති අතර මෙම පහසුකම මෙරට කිසිදු රෝහලක දක්නට නොලැබෙන සුවිශේෂී ලක්ෂණයක්ද වේ.

විශ්වවිද්‍යාල රෝහලේ පවතින මෙම පහසුකම එනම් ආගන්තුක නිවාසය සහ ආපනශාලාව කළමණාකරණය සහ පවත්වාගෙන යාම සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීම නොහොත් අභිලාශ ප්‍රකාශ කිරීම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන් හට කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙතින් ටෙන්ඩර්පත් කැඳවනු ලබයි.

හෝටල් කළමණාකරණය,ක්‍රියාත්මක කිරීම සහ සේවා සැපයීම පිළිබඳව අවම වශයෙන් අවුරුදු 03 ක පලපුරුද්දක් සමග වෘත්තීය කාර්ය මණ්ඩලයක් සහ ප්‍රමාණවත් මූල්‍ය ධාරිතාවක් සහිත ලංසුකරුවන් විසින් සවිස්තරාත්මක යෝජනාවක් ඉදිරිපත් කල යුතු වේ.

තරඟකාරී ලංසු තැබීම වෙනුවෙන් යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන් හට මේ සම්බන්ධව පවතින නීති රෙගුලාසි සහ කොන්දේසි පිළිබඳව කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මගින් හෝ කොආවි නිල වෙබ් අඩවියට පිවිසීම මගින් ලබා ගත හැක.

යෝජනා ඉදිරිපත් කිරීමේදී ඉදිරිපත් කරනු ලබන කවරයෙහි ඉහල වම් කෙලවරෙහි “හෝටල් කළමණාකරණ සේවා සැපයුම්කරුවකු තෝරාගැනීම (EOI)” යනුවෙන් සඳහන් කර 2020 සැප්තැම්බර් මස 14 වන දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ඉදිරිපත් කල යුතු වේ.

**උපකුලපති**
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
කඳවල පාර
රත්මලාන
දුර : 0112635268
ඊ මේල් : kdudefence@kdu.ac.lk
වෙබ් :http://www.kdu.ac.lk/ocls/tender-notices